# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,450 - 2025 අගෝස්තු මස 15 වැනි සිකුරාදා - 2025.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 298 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 300 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 04 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2025 ජූලි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


297 - B 082710 - 353 (2025/08)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් මධුමතී එම්. රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.02.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/1858 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දොඩම්පහළ නැගෙනහිර පදිංචි දොඩම්පහළ ආරච්චිගේ ඇලඩින් සිල්වා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1132 යටතේ 1982.04.30 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙක් නොමැති වීමෙන් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුව සහ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම්පහළ නැගෙනහිර ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, දොඩම්පහළ නැගෙනහිර නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක පී. 21/33 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මාර. 101 දරන පිඹුරෙහි අංක 22 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 1, පර්චස් 06 ක් ඇතැයි ගණන් බලා තිබෙන දළවැලිකඩවත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

*උතුරට* : මු. පි. මාර. 101 හි අංක 17 කැබැල්ල,
*නැගෙනහිරට* : මු. පි. මාර. 101 හි (මාර්ගය) 38 කැබැල්ල,
*දකුණට* : මු. පි. මාර. 101 හි අංක 23 කැබැල්ල,
*බස්නාහිරට* : මු. පි. මාර. 101 හි (මාර්ගය) 33 කැබැල්ල.

**මධුමතී එම්. රත්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
දික්වැල්ල.

2024 දෙසැම්බර් මස 16 වැනි දින.

08 - 148

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.09.03 දින ප්‍රදානය කර ඇති අංක හම්/6/ප්‍ර 46717 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වීරකැටිය, හතමුණයාය, කිරමවාඩිය පදිංචි රණමුකගේ පොඩිහාමි වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 98 යටතේ 2001.01.24 දින ලියාපදිංචි කර ඇති පහත සඳහන් ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවාපත්තුවේ, බටහිර බුද්දියාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අ. ග. පි. 242 - හතමුණ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : කටුආරහේන

*උතුරට* : මාර්ග රක්ෂිතය ද,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය ද,
*දකුණට* : මාර්ග රක්ෂිතය ද,
*බස්නාහිරට* : එල්. එල්. 21647 දරන ආර්. එම්. පොඩිහාමිගේ බිම් බදු ඉඩම ද වේ.

**අයි. ආර්. කේ. විතාරණ,**
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2025 මැයි මස 09 වැනි දින.

08 - 149/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1996.08.27 දින ප්‍රදානය කර ඇති අංක හම්/6/ප්‍ර 36633 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වීරකැටිය, හතමුන, කටුආරෙහේන පදිංචි රණමුකගේ පොඩිහාමි වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2262 යටතේ 1997.06.11 දින ලියාපදිංචි කර ඇති පහත සඳහන් ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවාපත්තුවේ, බටහිර බුද්දියාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අ. ග. පි. 242 - හතමුණ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : ගොඩැල්ලහේන

*උතුරට* : මාර්ග රක්ෂිතය ද,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය ද,
*දකුණට* : මාර්ග රක්ෂිතය ද,
*බස්නාහිරට* : එල්. එල්. 8456 ආර්. එම්. පොඩිහාමිගේ ඉඩම ද වේ.

**අයි. ආර්. කේ. විතාරණ,**
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2025 මැයි මස 09 වැනි දින.

08 - 149/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.10 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 41519 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 530, කුඩා ගම් 04, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර හි පදිංචි ජිනදාස වික්‍රමආරච්චි වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/95/4042/99 යටතේ 1999.10.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ කැණ්දගස්මංකඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දකුණු ඉවුර කු. ග. 04 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ අංක 484 කුඹුර දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : අංක 32 කෙත් ඇළ, අංක 483 එම්. ඩබ්. ආරියවතීගේ ඉඩම,
*නැගෙනහිරට* : බස්නා ඇළ, 483 - එම්. ඩබ්. ආරියවතීගේ ඉඩම,
*දකුණට* : අංක 485 - ඒ. ටී. පියදාසගේ ඉඩම,
*බස්නාහිරට* : කෙත් ඇළ රක්ෂිතය.

**අයි. එල්. වික්‍රමනායක,**
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින.

08 - 150/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1987.03.23 දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/5850 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බ්‍රාහ්මණයාගම පදිංචි ලියනආරච්චිගේ අන්දයස් වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 785 යටතේ 1988.04.06 දින ලියාපදිංචි කර ඇති පහත සඳහන් ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.09.05 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවාපත්තුවේ, කිංචිගුණේ දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්‍රාහ්මණයාගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක අ. ග. පි. 377 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 54 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.970 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම :

*උතුරට* : ලොට් 18 ප්‍රවේශ මාර්ගය ද,
*නැගෙනහිරට* : ලොට් 51 දරන කැබැල්ල ද, ලොට් 52 1/2 ප්‍රවේශ මාර්ගය ද,
*දකුණට* : මාර්ග රක්ෂිතය ද,
*බස්නාහිරට* : ලොට් 55 දරන කැබැල්ල ද වේ.

**අයි. ආර්. කේ. විතාරණ,**
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2025 මාර්තු මස 21 වැනි දින.

08 - 150/2

---

**ශුද්ධි පත්‍රිකාව**

මගේ යොමු අංකය : ඉලි/10/1/126

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වගන්තියේ (4) උප වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1597 අංක දරන හා 2009.04.08 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 104 වගන්තිය යටතේ වූ නිවේදනයේ ආර්. දීමනාපත්‍රකරුගේ නම වෛත්‍යාලිංගම් විජේසේකරම් ලෙසත්, විරෝධතා ඉදිරිපත් කිරීමට ලබා දී ඇති දිනය 2025.09.22 ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. පී. නන්දසේන,
ප්‍රාදේශීය ලේකම්,
වනාතවිල්ලුව.

2025 ජූලි මස 21 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

08 - 107

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/53351.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* පළාත්/ඉකො/ඉ9/කුලි. බට/දී.බ. 03.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 1125 උණලීය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උණලීය ගමේ මැණික්තැන්නහේන ඉඩම් පිහිටි අ. ග. පි. 2455 පිඹුරෙහි කැබලි අංක 363 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.212 ක් වූ රජයේ ඉඩම් කොටස ආගමික කටයුත්තක් සඳහා උණලීය මල්ගල ආරාමයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ:

*උතුරට* : අ. ග. පි. 2455 පත්‍ර 12 අතිරේක 11 හි කැබලි අංක 362,
*නැගෙනහිරට* : අ. ග. පි. 2455 පත්‍ර 12 අතිරේක 11 හි කැබලි අංක 365 සහ 259,
*දකුණට* : අ. ග. පි. 2455 පත්‍ර 12 අතිරේක 11 හි කැබලි අංක 174,
*බටහිරට* : අ. ග. පි. 2455 පත්‍ර 12 අතිරේක 11 හි කැබලි අංක 174.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහ (30) යි. (2025.05.23 දින සිට 2055.05.22 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල .*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2025 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*වාර මුදල* : අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම මල්ගල ආරාමය පවත්වාගෙන යාම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)*(i.) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි ආරාමය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලුම කටයුතු කළ යුතුය.

(ii.) බදු ගන්නන් විසින් මෙකී ඉඩමෙහි, පිහිටි ගස්කොළන් ආදිය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කළ යුතුය. කිසියම් හේතුවක් නිසාවත් දිසාපතිගේ ලිඛිත අවසරයක් නොලබා මෙම ගස්කොළන් කපා හෙලීම, විනාශ කිරීම හෝ හානි කිරීම නොකළ යුතුය.

*(ඉ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ඉහත (ඇ) හි සඳහන් කටයුත්ත සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(උ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඌ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත්කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(එ)* 2025.05.23 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඒ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,  
සහකාර ඉඩම් කොමසාරිස්,  
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 31 වැනි දින,  
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,  
"මිහිකත මැඳුර",  
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි  
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08 -160

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/68034.  
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* SPLC/GAL/5/10/3/198

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 33 බී, බොරළුහේන ග්‍රාම නිලධාරි වසමේ, හත්තක ගමේ දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 10 ක් වූ රජයේ ඉඩම් කොටස පිවිතුරු සුබසාධක සමිතියේ භාරකාර මණ්ඩලය වෙත දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ:

*උතුරට* : ස්වශක්ති මිතුරෝ පදනම සමිතියට වෙන්කළ බිම (222 C කොටසක්),  
*නැගෙනහිරට* : හත්තක උනන්ඕවිට සණස සමිතියට වෙන්කල බිම,  
*දකුණට* : අතුරු මාර්ගය,  
*බටහිරට* : අතුරු මාර්ගය.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු පහයි (05) (2022.06.30 දින සිට 2027.06.29 දින දක්වා);

*වාර්ෂික බදු මුදල .*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2022 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*(ආ)* මෙම ඉඩම **පිවිතුරු සුහසාධක සමිතියේ ප්‍රජා ශාලාවක් ඉදිකිරීම සඳහා** හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුලත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත්කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 අගෝස්තු මස 02 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08 -209